# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

**AAT/ 35 /2025 (PSC)**
**AAT/ 36 /2025 (PSC)**
**AAT/ 37 /2025 (PSC)**

ඩබ්.ඒ.ආර්.රෝහිත වීරසගොඩ,
ඩබ්.එම්.තුෂාරි කාංචනා,
යූ.කේ.ඒ.ප්‍රියහර්ෂනී.

**අභියාචකවරුන්.**

**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය :-2026.01.13**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචකවරු වෙනුවෙන් නීතිඥ ශාන්ත ජයවර්ධන මහතා සමග නීතිඥ තිලිණි විදානගමගේ මිය.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් බී.කේ.ඩී.එන්. ජයතිස්ස මිය.

## -<u>නියෝගය</u>-

## ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය

මෙහි නම් සඳහන් අභියාචකවරුන් ශ්‍රී ලංකා තක්සේරු සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ නිලධාරීන් ලෙස, 2012.10.01 හා 2013.12.17 දින සේවයට එක්වී ඇති අතර, 2016.02.02, 2016.01.13 හා 2017.06.27 දිනැතිව ප්‍රධාන තක්සේරු තනතුරට පත්ව ඇත. 2019.09.27 දින අනුමත නව බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන යටතේ සියලුම දෙනා ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ II පන්තියට 2019.09.27 දින අන්තර් ග්‍රහණය සිදුකර ඇත. එමෙන්ම අදාළ අභියාචකවරුන් 2022.10.01 දින සහ 2023.12.17 දින සිට ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුවේ II

පන්තියේ I ශ්‍රේණියට උසස්වීම් ලැබ දැනට සේවය කරනු ලබයි. අභියාචකවරුන් තිදෙනාම 2021.04.25 දින ගැසට් පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා තක්සේරු සේවයේ විධායක නිලධාරි ගණයේ I පන්තියේ III ශ්‍රේණියේ තනතුරු සඳහා වන සීමිත තරඟ විභාගයට 2023 අයදුම්කර ඇත. එසේම 2023.10.21 දින පැවති අදාළ ලිඛිත විභාගයට මුහුණ දී ඇති අතර, 2024.02.15 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයටද මෙම තිදෙනා ඇතුළුව 26 දෙනෙක් මුහුණ දී ඇත. මෙම ලිඛිත විභාගයෙන් සහ සම්මුඛ පරීක්ෂණයේදී ලැබූ ලකුණු අනුව ඉහළම ලකුණු ලැබූ 21 දෙනා අනුපිළිවෙල අනුව අදාළ තනතුරු සඳහා තෝරා ගෙන ඇත. එසේම එම 21 දෙනා සඳහා 2024.09.02 දින ලිපිය අනුව, 2024.02.15 දින සිට බලපැවැත්වෙන පරිදි පත්වීම් ලබා දී ඇත. අභියාචකවරුන් දන්වා සිටින්නේ, තමන්ට එම අවස්ථාවේ පත්වීම් නොලැබුණ බව සඳහන් කරමින්, තමන්ලාට ද අදාළ දිනට පත්වීම් ලබාදෙන ලෙස ඉල්ලා අභියාචනයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කළ බව සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025.01.01 දිනැති ලිපිය අනුව අදාළ ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති බවයි. අදාළ තීරණයෙන් තෘප්තියට පත් නොවූ අභියාචකවරු මෙම අධිකාරයට 2025.02.13 දින අභියාචනයක් ඉදිරිපත් කරමින් ඉල්ලා ඇත්තේ,

“(a) Quash and/or amend vary the decision contained in item No.2(1) of the letter dated 01st January 2025 bearing reference PSC/APP/8/3/19/2020 – ***A13*** communicated by the letter – *A14*

(b) Make Order preventing the Public Service Commission form filling the three (3) vacancies allocated for Limited Recruitment from Open Recruitment or Recruitment on the basis of service experience and merit; and/or

(c) Direct the Public Service Commission to promote me to the Class I Grade III (Valuer) of Sir Lanka Valuation Service with effect from 15th February 2024.”

ලෙසය. අදාළ කරුණු තහවුරු කිරීම ලිපි ලේඛන රැසක් ඇමුණුම් ලෙස ඉදිරිපත් කර ඇත. එසේම මෙම අධිකාරය ඉදිරියේ විවෘත අධිකරණයේ දී ද කරුණු පැහැදිලි කරන ලදි. අභියාචකවරුන් දන්වා සිටින්නේ, මෙම පුරප්පාඩු ගණනය කළ ආකාරය නිවැරදි නොවන බවය. සත්‍ය ලෙසම පුරප්පාඩු 21 නොව 24ක් තිබිය යුතු බවය. ඒ සඳහා ප්‍රධාන ලෙස

පෙන්වන්නේ II – I පන්තියේ තනතුරු 120ක් අනුමතව ඇති නිසාත්, බඳවා ගැනීමේ පරිපාටිය අනුව 20%. 20%. 60% ලෙස විවෘත, සීමිත හා කුසලතා මත බඳවා ගත යුතු බවයි. ඒ අනුව පුරප්පාඩු 120 x 20/100 = 24 සීමිත තරඟ විභාගය යටතේ බඳවා ගත යුතු බවත්, දැනට 21 දෙනෙක් සඳහා පත්වීම් ලබා දී ඇති බැවින්, ඉතිරි පුරප්පාඩු 03 සඳහා අභියාචකවරුන් තුන්දෙනා පත්කරන ලෙසය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් 2025.10.31 දිනැතිව, එම අයගේ නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. අදාළ නිරීක්ෂණ වලට අනුව ලිපි ලේඛන රැසක් ඉදිරිපත් කර ඇත. මෙහිදී ඉතා වැදගත් වන්නේ, බඳවා ගැනීමේ පරිපාටිය වේ. අභියාචකවරුන් සේවයට බැඳෙන අවස්ථාව වන විට බලපැවැත්වූයේ අංක 1499/5 හා 2007.05.28 දින අනුමත කර තිබූ සේවා ව්‍යවස්ථාවයි. එය 2019 වසරේ සංශෝධනය කර ඇත. අංක 2142/75 හා 2019.09.27 දරණ ගැසට් පත්‍රය මගින් එය ප්‍රසිද්ධ කර ඇත. දැනට වලංගුව පවතින්නේ එම සේවා ව්‍යවස්ථාවයි. 03 යටතේ සේවය වර්ගීකරණය කර ඇත.

| | | | වැටුප් තලය | අනුමත තනතුරු ගණන |
|---|---|---|---|---|
| I. | ජ්‍යෙෂ්ඨ විධායක | විශේෂ ශ්‍රේණිය | SL3 – 2016 | 05 |
| II. | විධායක | I ශ්‍රේණිය | SL1 – 2016 20 පියවර | 16 |
| | | II ශ්‍රේණිය | SL1 – 2016 12 පියවර | 80 |
| | | III ශ්‍රේණිය | SL1 – 2016 1 පියවර | 120 |
| III. | ක්ෂේත්‍ර | I – MN 5 – 2016 12 පියවර | | |
| | | II – MN 5 – 2016 1 පියවර | | 360 |

5 ජේදය යටතේ වැටුප් පිළිබඳව සහ 6 ජේදය යටතේ අනුමත තනතුරු ප්‍රමාණය සහ 7 ජේදය යටතේ බඳවා ගැනීමේ ක්‍රම වේදය පැහැදිලිව දක්වා ඇත. මෙම පදනම අනුව අනුමත තනතුරු 120 X 20/100 ලෙස තනතුරු 24ක් පුරප්පාඩු පවතින බව අභියාචකවරුන් ප්‍රකාශ කර සිටී. එසේ වුවත් සත්‍ය ලෙසම පවතින්නේ ඊට අඩු තනතුරු ප්‍රමාණයක් බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව ප්‍රකාශ කරයි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කළ වාර්තාවේ 7, 8, 9, 10, 11, 12 ජේද මගින් එය පැහැදිලි කර ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කළ ලිපියේ ඇමුණුම් 03 ලෙස සඳහන් තක්සේරු දෙපාර්තමේන්තුව, රජයේ

ප්‍රධාන තක්සේරුකරු අත්සන් කර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවනු ලැබූ 2019.11.28 දිනැති ලිපියේ 2 ජේදය අනුව එය පැහැදිලි කර ඇත. අදාළ ලිපියට අනුව තනතුරු 120 අනුමතව ඇති බවත්, මේ වන විටත් 15 දෙනෙක් සේවයේ යෙදී සිටින බව සහ පුරප්පාඩු 105ක් පවතින බව සනාථ කර ඇත. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් විසින් මුදල් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් අමතා 2020.01.29 දින යවන ලද ලිපිය මගින් ද අදාළ තනතුරේ පුරප්පාඩු 105 ක් පිරවීම සඳහා අනුමත කරන ලද බව දන්වා ඇත. එයටද අමතරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2020.07.28 දින ලේකම්, මුදල් අමාත්‍යාංශයට යවන ලද ලිපිය මගින් ද 2019.09.27 අනුව පවතින පුරප්පාඩු 105 පිරවිය යුතු අයුරු උපදෙස් දී ඇත. එමෙන්ම මෙම තත්ත්වය වඩාත් තහවුරු වන්නේ, 2023.03.08 දින පැවැති අමාත්‍ය මණ්ඩ තීරණය මගින් අදාළ තනතුරට පුරප්පාඩු 21ක් පවතින බව සහ එය බඳවා ගැනීමේ සීමිත පදනම මත බඳවා ගැනීමට අනුමත කර ඇත යන කරුණු හේතුවෙනි. එසේම 2023.04.21 දින ප්‍රසිද්ධ කරන ලද ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකා තක්සේරුකරු සේවයේ විධායක නිලධාරී ගණයේ I පන්තියේ III ශ්‍රේණියේ තක්සේරුකරු තනතුරට බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය – 2023 යටතේ පුරප්පාඩු 21ක් සඳහා බඳවා ගැනීමට කටයුතු කරන බව පැහැදිලිව දක්වා ඇත. මෙසේ අවස්ථා රැසකදී පුරප්පාඩු ගණන 21 ලෙසට සඳහන්ව තිබුණ බව පැහැදිලිව ඔප්පු වේ. එසේ වුවත් 2025 වසරේ අභියාචනයන් ඉදිරිපත් කරන විට එය 24ක් ලෙස සඳහන් කළද, ඊට පෙර කිසිදු අවස්ථාවක පුරප්පාඩු 21 පිළිබඳව විරෝධතාවයක් හෝ කරුණු දැක්වීමක් සිදුකර ඇති බවක් දන්නට නැත. අභියාචකවරු දන්වා සිටින්නේ ඒ වන විට සිටි 15 දෙනා කුසලතාවය මත බඳවා ගෙන ඇති බවය. කෙසේ වුවද, කුමන අයුරින් බඳවා ගත්තද මේ අවස්ථාව වන විට 15 දෙනෙකු අදාළ තනතුරේ සේවය කරන බැව් පිළිගැනීමට සිදුවේ. ඒ අනුව සත්‍ය ලෙසට පවතින පුරප්පාඩු 105 බවද තීරණය කිරීම නිවැරදිය. ඒ අනුව මේ අවස්ථාවේ අභියාචකවරුන් ඉදිරිපත් කරන මෙම ඉල්ලීමට ඉඩදීම අපහසු බව පෙනේ. එසේම අදාළ 26 දෙනාගේ ලකුණු ලේඛනයේ පරීක්ෂා කිරීමේ දී පෙනී යන්නේ, පළමු ස්ථානය ගත් අය ලකුණු 209.96 ලබා ඇති අතර 21 වැනි ස්ථානය ලැබූ අයදුම්කරු ලකුණු 157.62 ලබා ඇති බව සහ ඉන්පසුව සිටින මෙම අභියාචකවරු 3 දෙනා පිළිවෙලින් ලකුණු 151.6, 146.8, 146.63, 146.35 ලෙස ලබා සිටින බවයි. සියලු කරුණු

අනුව අදාළ අභියාචකවරුන් ඉල්ලා සිටින පරිදි පුරප්පාඩු 24 ලෙස සළකා මෙම ඉල්ලීමට ඉඩ ලබාදීම අපහසු බව පෙනේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය තවදුරටත් සනාථ කරමු.

ඒ බැව් අභියාචක, ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වන්න.

අභියාචනය ප්‍රතික්ෂේප කරමු.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

(එස්.නන්දසේකරන්)
(සාමාජික)

ලලිතා/-